සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

<u>සැලකිය යුතුයි.</u>

**(i)** සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

---

- පහත දැක්වෙන ගීත, පද්‍ය හා සංවාද ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 07 දක්වා පිළිතුරු සපයන්න.

(a) උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා

(b) රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දැකා මෙන් නෙත් රැවිය මට
අදුරු මරු දැකා නර බිල්ල ගන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

(c) යක්ෂණිය - පීකොක්, තීරෝස්, බිස්ටල්, නන්දසේන, පොඩි අප්පුහාමි, පියසේන
යකැදුරා - එක දරුවෙක් වඩාගෙන නම් කීයක් කියෙව්වද? හරි වැඩක් නෙ බොල.
යක්ෂණිය - ජන්දෙට, ජන්දෙට කරන්න ගිහින් තමයි මට වැරදුණේ, තාත්තලා ගොඩායි

(d) බමුණා - ( අත දිගු කර දක්වමින්) දේව මනුස්සානං
අත්ථි,බහු මනුස්සානං අත්ථි,මණ්ඩපං අත්ථි,
ආලෝකං අත්ථි,කිං කාරණං අත්ථි
ඇදුරා - මේ කරන්නේ තොවිලයක්....

(e) ජටා හිස දරමිණ : ශුද්ධ අෂ්ඨක වැල් ද කරලන
කුඩය ගෙන සුරතින : මෙසේ බමුණෙක් සබේ නික්මුණ

(f) ගැහැණු වෙස් ගත් ඇදුරා : අනේ ගුරුන්නාන්සේ... මේ කණ්ණාඩියෙන් මුකුත්ම පේන්නේ නැනේ..
ගුරුන්නාන්සේ : හොඳට බලන්න එතකොට පෙනේවි.

(01) ඉහත සංවාද ඛණ්ඩ අතුරින් පහතරට සම්ප්‍රදායේ ලෙඩ රෝග නිවාරණය සඳහා පවත්වනු ලබන ශාන්තිකර්මයක අන්තර්ගත පද්‍ය සංවාද කොටස් ඇතුලත් අක්ෂර ඛණ්ඩය වන්නේ කුමක් ද?

(1) a (2) c (3) d (4) f

(02) ඉහත d අක්ෂර ඛණ්ඩය අයත් අන්තර් රංග අවස්ථාව කුමක් ද?

(1) වඩිග පටුන (2) කපුයක්කාරිය

(3) දොළහා පෙළපාලිය (4) සූනියම් යක්ෂනියගේ වේෂත්‍රය

(03) පහතරට සම්ප්‍රදායේ කාන්තාවන් වෙනුවෙන් ම පවත්වනු ලබන ශාන්තිකර්මයක අන්තර්ගත කවි සංවාද අක්ෂර ඛණ්ඩය වන්නේ කුමක් ද?

(1) d හා f (2) c හා e (3) a හා f (4) a හා e

(04) ඉහත d සංවාද කණ්ඩය අයත් ශාන්තිකර්මය කුමක්ද?

(1) සූනියම් යාගය (2) රට යකුම (3) සන්නි යකුම (4) ගම මඩු

(05) ඉහත c සංවාද ඛණ්ඩය ඇතුළත් අන්තර් රංග අවස්ථාව කුමක්ද?

(1) සූනියම් යක්ෂණියගේ වේෂත්‍රය (2) දොළහ පෙළපාලිය

(3) වඩිග පටුන (4) කපුයක්කාරිය

(06) ඉහත ශාන්තිකර්ම අතුරින් "වෙස් මුහුණු" පැළඳ කරනු ලබන අන්තර් විරාම රංග අවස්ථාවක් දැක්වෙන කවි සංවාද අතුලත් වරණය වන්නේ කුමක් ද?

(1) a (2) c (3) d (4) f

(07) ඉහත f අක්ෂරයෙන් දක්වා ඇති සංවාද ඛණ්ඩය ඇතුලත් ශාන්ති කර්මය වන්නේ කුමක් ද?

(1) රිද්දි යාගය (2) සූනියම් යාගය

(3) සන්නි යකුම (4) ගම් මඩු

- ප්‍රශ්න අංක 08 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

(08) "ප්‍රාසාංගික කලාවන්" සම්බන්ධ ලක්ෂණයක් අන්තර්ගත නිවැරදි වරණය වන්නේ කුමක්ද?

(1) පටිගත කොට ගබඩා කර ගත හැකිය (2) සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබේ

(3) ඒකලව නිර්මාණය කල හැකිය (4) කියවා හෝ අසා රස විඳිය හැක

(09) වේදිකා නාට්‍යයක රඳා පැවැත්ම වඩාත් තීරණය වන සාධකය කුමක් ද?

(1) නාට්‍ය සංගීතය (2) නළු - නිළියන්

(3) ප්‍රේක්ෂක ප්‍රතිචාර (4) අධ්‍යක්ෂවරයා

(10) "ආනුශංගික" කලා ශිල්ප ඇතුළත් වරණය වනුයේ කුමක් ද?

(1) රංගාලෝකය, අංග රචනය, පිටපත, රංග භාණ්ඩ

(2) රංග වස්ත්‍ර,අභිනය, රංගාලෝකය, නාට්‍ය පිටපත

(3) නාට්‍ය පිටපත, අංග රචනය,පසුතල, රංග භාණ්ඩ

(4) පසුතල, රංගාලෝකය, රංග භාණ්ඩ, අංග රචනය

(11) "ප්‍රාසාංගික කලාවන්" පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(1) සංගීතය, බැලේ, චිත්‍ර, නර්තනය

(2) මුද්‍රා නාට්‍ය, මූර්ති, බැලේ, සංගීතය

(3) බැලේ, මුද්‍රා නාට්‍ය, සංගීතය, නාට්‍ය

(4) නාට්‍ය, සිනමාව, බැලේ,සංගීතය

(12) "නෘත්‍ය" යන්නෙහි නිවැරදි නිර්වචනය කුමක් ද?

(1) හුදු නර්තනය පමණකි.

(2) සතර අභිනයම භාවිතා කරයි.

(3) අර්ථයක් හෝ භාවයක් දැක්වෙන තාලාන්විත නර්තනයකි.

(4) මුල, මැද, අග සහිතව ගොනු කොට ඇති ආනුශංගික කලාවන්ගේ සංකලනයකි.

(13) "රූපණය" පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංග දෙක කුමක් ද?

(1) අභ්‍යන්තරික ප්‍රකාශනය හා බාහිර ප්‍රකාශනය

(2) බාහිර සමාරෝපය හා අභ්‍යන්තර සමාරෝපය

(3) රංග රචනය හා අංග රචනය

(4) ක්ෂණික නිරූපණ හා අභිරූපණය

(14) රංග ක්‍රීඩාවල නිරත වීමෙන් නළුවකුට ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ කුමක් ද?

(1) ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ලැබීම.

(2) මානසික ඒකාග්‍රතාවය රැක ගැනීම.

(3) සතර අභිනයෙන් තොරව වුවද රංගනයේ යෙදිය හැකි වීම.

(4) පරිකල්පන ශක්තිය වර්ධනය වීම.

(15) නාට්‍ය ප්‍රේක්ෂකයා වෙත ගෙන යනු ලබන මාධ්‍ය වන්නේ කුමක් ද?

(1) පිටපතයි (2) වේදිකාවයි (3) සංගීතයයි (4) සතර අභිනයයි

(16) "ස්වභාවික චලන" යනු කුමක් ද?

(1) කිසියම් සම්ප්‍රදායකට අනුව කරනු ලබන චලනය.

(2) අනුකරණය කරමින් කරනු ලබන චලනය.

(3) රිද්මයකට අනුව කරනු ලබන චලනය.

(4) ආයාසයකින් තොරව කරනු ලබන චලනය.

(17) දර්පණ අභ්‍යාසයෙන් මූලිකව බලාපොරොත්තු වන අරමුණක් වන්නේ කුමක්ද?

(1) නළුවාගේ පෞරුෂ වර්ධනය

(2) පරිකල්පනය වර්ධනය කිරීමය

(3) පිටපත මතක තබා ගැනීමය

(4) හඬ උච්චාරණය ප්‍රගුණ කිරීමයි

(18) කතන්දරයකින් නාට්‍යයක් වෙනස් වන්නේ

(1) සංවාද හා රංග විධාන ඇති බැවිනි (2) කියවා රස විඳිය හැකි බැවිනි

(3) සාමූහික බැවිනි (4) ගබඩා කිරීමේ ඇති හැකියාවෙනි

(19) "චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් වීමේ නළු කාර්යය" හඳුන්වනු ලබන්නේ,

(1) අනුකරණය නමිනි
(2) අභිරූපණය නමිනි
(3) භූමිකා නිරූපණය නමිනි
(4) අනුරූපණය නමිනි

(20) ලෝක ධර්මී නාට්‍යයක ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ,

(1) අතිශයෝක්තියෙන් යුතුව ඉදිරිපත් කෙරෙන රංගනයයි.
(2) වේදිකා අලංකරණය අතිශයෝක්තියෙන් සිදු කිරීමයි.
(3) ස්වභාවික තත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.
(4) යථාර්ථය ඒ වූ ලෙසටම වේදිකාවේ ඉදිරිපත් කිරීමයි.

★ පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ක | ච | ට | ත |
|---|---|---|---|
| තරිබෑනා<br>පබාවතී<br>රත්කඳ<br>මොදර මොල<br>මනමේ<br>කදාවළලු | සුගතපාල ද සිල්වා<br>හෙන්රි ජයසේන<br>පරාක්‍රම නිරිඇල්ල<br>එදිරිවීර සරච්චන්ද්‍ර | අන්දර මල්<br>සීතාම්බර පට<br>මකරරාක්ෂ<br>චරන්දාස්<br>මැටි කරත්තය | ජනේලය<br>කුවේණි<br>අපට පුතේ මඟක් නැතේ<br>හුනුවටයේ කතාව<br>අහස් මාළිගා |

(21) "සොඳුරු ආහ්ලාදායකයා" කෘතිය රචනා කළ නාට්‍යකරුවාගේ නාට්‍ය ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) 'ක' කාණ්ඩය
(2) 'ච' කාණ්ඩය
(3) 'ට' කාණ්ඩය
(4) 'ත' කාණ්ඩය

(22) "ජන කරළිය" මගින් නිර්මාණය කළ නාට්‍ය ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) 'ක' කාණ්ඩය
(2) 'ච' කාණ්ඩය
(3) 'ට' කාණ්ඩය
(4) 'ත' කාණ්ඩය

(23) " ස්වතන්ත්‍ර නාට්‍ය" පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) 'ක' කාණ්ඩය
(2) 'ච' කාණ්ඩය
(3) 'ට' කාණ්ඩය
(4) 'ත' කාණ්ඩය

(24) ටෙනිසි විලියම්ස්ගේ ද ග්ලාස් මෙනාජරි නාට්‍යයේ පරිවර්තන නාට්‍ය වන්නේ මින් කුමක්ද?

(1) හරිම බඩු හයක්
(2) හුණුවටයේ කතාව
(3) චරන්දාස්
(4) අහස් මාළිගා

(25) ඉන්දීය නාට්‍යයක පරිවර්තනයක් ඇතුළත් කාණ්ඩය වන්නේ කුමක් ද?

(1) 'ක' කාණ්ඩය
(2) 'ච' කාණ්ඩය
(3) 'ට' කාණ්ඩය
(4) 'ත' කාණ්ඩය

(26) 'ත' කාණ්ඩයේ නාට්‍ය අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය කරුවා වන්නේ,

(1) නාට්‍යවේදී හෙන්රි ජයසේන විසිනි
(2) නාට්‍යවේදී සුගතපාලද සිල්වා විසිනි
(3) නාට්‍යවේදී සයිමන් නවගත්තේගම විසිනි
(4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසිනි

(27) " ජන කරළිය" නාට්‍ය කණ්ඩායම නිර්මාණය කල නාට්‍යකරුවන් වන්නේ,

(1) එච්.ඒ පෙරේරා හා මානෙල් ජයසේනයන් ය.
(2) හෙන්රි ජයසේන හා ජැක්සන් ඇන්තනී ය.
(3) සයිමන් නවගත්තේගම හා කෞෂල්‍යා ප්‍රනාන්දු ය.
(4) පරාක්‍රම නිරි ඇල්ල හා එච්.ඒ පෙරේරා ය.

(28) " රංග විධාන" අවශ්‍ය වන්නේ කවුරුන් සඳහාද

(1) නළුවන්ට ය.
(2) ආනුශංගික ශිල්පීන්ට ය.
(3) ප්‍රේක්ෂකයින්ට ය.
(4) නාට්‍ය විචාරකයින්ට ය.

(29) නළුවකු තම ස්වභාවය අතහැර අන් වේෂයන්ට පත් වීම හඳුන්වන්නේ කුමන නමකින්ද?

(1) අනුකරණය
(2) චරිතායනය
(3) සමාරෝපය
(4) අභිරූපණය

(30) නළු වරණය යනුවෙන් අර්ථ දැක්වෙන්නේ කුමක් ද?

(1) නළු නිළියන් සඳහා වේෂභූෂණ නිර්මාණය කිරීමයි.
(2) නළු නිළියන් සඳහා සිදු කෙරෙන පෙර පුහුණු වීම් ය.
(3) නළු නිළියන්ගේ රංගන්‍ය කිසියම් වාරණයකට ලක් කිරීම ය.
(4) නාට්‍ය නිර්මාණයක චරිත සඳහා උචිත නළු නිළියන් තෝරා ගැනීම ය.

(31) බෞද්ධ පූජා කර්ම පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) දෙවොල් මඩුව, දොරකඩ අස්න, ආලවක දමනය,
(2) මිලින්ද ප්‍රශ්නය, ගම් මඩු, යුගාසන බණ
(3) ආලවක දමනය, දොරකඩ අස්න, යුගාසන බණ
(4) දොරකඩ අස්න, ගම් මඩු, රට යකුම

(32) ගමන් විලාස, කටහඬ, මුහුණේ ඉරියව්, බාහිර පෙනුම ඉහත ස්වරූප වලට අදාල අභිනය ප්‍රභේද දැක්වෙන වරණය කුමක් ද?

(1) ආහාර්යය, සාත්වික, වාචික, ආංගික
(2) අංගික, වාචික,සාත්වික, ආහාර්යය
(3) සාත්වික, වාචික, ආහාර්යය, ආංගික
(4) ආංගික, වාචික, ආහාර්යය, සාත්වික

(33) " ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත" මෙම ප්‍රකාශනය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) බර්නාඩ් ෂෝ (2) ටෙනසි විලියම්

(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4) භරතමුණි

(34) පිටපතකින් තොරව සීමිත කාලයකදී යම් කිසි අවස්ථාවක් නිරූපණය කිරීම හඳුන්වන්නේ,

(1) අභිරූපණය ලෙසයි. (2) අනුකරණය ලෙසයි.

(3) අනුරූපණය ලෙසයි. (4) ක්ෂණික නිරූපණය ලෙසයි.

(35) නාට්‍යධර්මී නාට්‍යයක වේදිකා පසුතල ප්‍රේක්ෂකයා වෙත ගෙන යනු ලබන්නේ

(1) පසුතල නිර්මාණ මගිනි (2) ගීත, කවි, කාව්‍යමය සංවාද

(3) චිත්‍ර වස්ත්‍ර මගිනි (4) සංගීතය මගිනි

(36) රංග භූමිය ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේද?

(1) 5කි (2) 9කි (3) 10කි (4) 15කි

- ප්‍රශ්න අංක 37 සිට 40 දක්වා දී ඇති ඡයාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

(37) මෙහි "ක" ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,

(1) විජේරත්න වරකාගොඩ මහතා ය. (2) ගාමිණී සමරකෝන් මහතා ය.

(3) බන්දුල ජයවර්ධන මහතා ය. (4) ශ්‍රීයන්ත මෙන්ඩිස් මහතා ය.

(38) ඉහත "ග" ඡායාරූපයෙන් දැක්වෙන රංගන ශිල්පිණිය වන්නේ,

(1) මානෙල් ජයසේන (2) මැණිකේ අත්තනායක

(3) අනුලා බුලත්සිංහල (4) කෞශල්‍යා ප්‍රනාන්දු

(39) "රතු හැට්ටකාරී" තාරාවෝ ඉගිලෙති ආදී නාට්‍ය වල චරිත නිරූපණය කරන ලද්දේ

(1) 'ක' විසිනි (2) 'ග' විසිනි (3) 'ජ' විසිනි (4) 'ට' විසිනි

(40) "ට" ඡායාරූපයෙන් දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,

(1) බන්දුල ජයවර්ධන (2) විජේරත්න වරකාගොඩ

(3) සයිමන් නවගත්තේගම (4) හෙන්රි ජයසේන

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper II | කාලය / காலம் / Time පැය 02 |

"පළමුවැනි ප්‍රශ්නය" හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) දික්තල කාලගෝල නාට්‍යයේ මුල් රචකයා සහ වර්තමාන අධ්‍යක්ෂවරයා කවරෙක් ද?

(2) මෙම නාට්‍යයේ පසුබිම් සංගීතය සඳහා යොදා ගෙන ඇති තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

(3) මෙම නාට්‍යය සඳහා ආභාෂය ලබා ඇති නාටක විශේෂය කුමක් ද?

(4) දික්තල කාලගෝල නාට්‍යයේ කතා පුවත ඇතුළත් ජාතක කතාව කුමක් ද?

(5) මෙම නාට්‍ය කුමන නාට්‍ය සම්ප්‍රදායකට අයත් වේද?

(6) මෙම නාට්‍යයේ තේමාව තුමක්ද? (ලකුණු 2×6 = 12)

(02) (1) "අංග රචනය" යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(2) අංග රචනයේහි මූලික ප්‍රභේද නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(3) අංග රචනයේ දී භාවිතයට ගන්නා මූලික ද්‍රව්‍ය 03 ක් සහ උපකරණ 03 ක් නම් කරන්න (ලකුණු 06)

(03) (1) රංග භූමියක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(2) රංග භූමිය වර්ග 03 ක් නම් කර වර්තමානයේ බහුලව භාවිතා කරන නූතන රංග භූමියේ බෙදීම් ඇඳ දක්වන්න. (ලකුණු 06)

(3) රංග භූමියක තිබිය යුතු විශේෂ ලක්ෂණ 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(04) (1) කතන්දරයක ලක්ෂණ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(2) කතන්දරයක හා නාට්‍යයක සමාන අසමානතා 02 බැගින් ලියන්න. (ලකුණු 04)

(3) වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (1) රංග අභ්‍යාසය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(2) රංග අභ්‍යාසවල යෙදීමෙන් රූපණ ශිල්පීන්ට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.(ලකුණු 04)

(3) ඔබ දන්නා රංග ආභ්‍යාස 03 ක් නම් කර ඉන් එක් රංග ආභ්‍යාසයක් පන්ති කාමරයේ සිදු කළ අයුරු විස්තර කරන්න. (ලකුණු 06)



(06) (1) ඉහත ඡායාරූපයෙහි දැක්වෙන නාට්‍යමය අවස්ථාව ඇතුළත් ශාන්ති කර්මය කුමක් ද? (ලකුණු 02)

(2) එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු දක්වන්න. (ලකුණු 04)

(3) ඉහත ශාන්ති කර්මයෙහි අන්තර්ගත නාට්‍යයම පෙළපාලි නම් කර , ඉන් එක් පෙළපාලියක අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කතා සැකිල්ල ඇසුරින් ඔබ කැමති පරිදි නාට්‍ය පෙළක් විනාඩි 05ක කාලයක් තුල රඟ දැක්වීමට ප්‍රමාණවත් පරිදි සකස් කරන්න.

★ දේවාලයක කපුවකු දේවාරූඪයෙන් ශාස්ත්‍ර කියමින් සිටී. පූජා භූමිය, අවට අධික සෙනඟ අතරින් එක් පුද්ගලයකු හදිස්සියේ කලාන්ත වී බිම ඇද වැටෙයි. එම පුද්ගලයා කොරෝනා රෝගියකු බවට පිරිස් අතර කසු කුසුවකි.

නාට්‍යයෝචිත අවස්ථා නිර්මාණය කිරීම (ල . 04)
රංගවිධාන හා සංවාද භාවිතය (ල . 04)
ක්‍රමානුකූලව රචනය ගොඩ නැගීම සහ සමස්ථ නිමාව (ල. 04)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2020
# Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 10

විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව

ප්‍රායෝගික පරීක්ෂණය

| | | |
|---|---|---|
| (1) | නාට්‍ය ගීතය ඉදිරිපත් කිරීම.(කේවල) | ල . 20 |
| (2) | කතාපුවතක් නාට්‍යායානුසාරීව ඉදිරිපත් කිරීම.(සාමූහික) | ල . 20 |
| (3) | ක්ෂණික නිරූපණ අවස්ථාවක් ඉදිරිපත් කිරීම.(සාමූහික) | ල . 20 |
| (4) | නිර්දිෂ්ය පෙළෙහි ඇතුළත් නාට්‍ය සංවාද උච්චාරණය.(කේවල) | ල . 20 |
| (5) | දික්තල කාලගෝල නාට්‍යයෙහි එන කෙටි අවස්ථාවක් සාමූහිකව නිරූපණය | ල . 20 |

(මුළු ල . 100)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Western Province Education Department

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 3 | (21) 2 | (31) 3 |
| (2) 1 | (12) 3 | (22) 3 | (32) 2 |
| (3) 3 | (13) 1 | (23) 1 | (33) 1 |
| (4) 1 | (14) 3 | (24) 4 | (34) 4 |
| (5) 1 | (15) 4 | (25) 3 | (35) 2 |
| (6) 2 | (16) 4 | (26) 1 | (36) 2 |
| (7) 1 | (17) 1 | (27) 4 | (37) 3 |
| (8) 2 | (18) 1 | (28) 1 | (38) 1 |
| (9) 3 | (19) 3 | (29) 3 | (39) 3 |
| (10) 4 | (20) 3 | (30) 4 | (40) 2 |

## II පත්‍රය

(01) (1) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ, පුණ්‍යසේන ගුණසිංහ
(2) මද්දලය
(3) නාඩගම්
(4) උම්මග්ග ජාතකය
(5) නාට්‍ය ධර්මී
(6) නොගැලපෙන දේවල් කිරීමට යාමෙන් ඇති වන ගැටළු පෙන්වා දීම. (ල. 12)

(02) (1) රූපනයේදී නළු-නිළියන්ගේ මුහුණුවල ලක්ෂණ නාට්‍යට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමේ කාර්යය අංගරචනයයි.
(2) සරල අංග රචනය/ චරිතාංග අංග රචනය.
සරල අංග රචනය - පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින් ඉදිරිපත් කරයි.
චාරිතාංග අංග රචනය - පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය වෙනත් අයුරකින් රචනා කිරීමයි.
(3) නිවැරදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල. 12)

(03) (1) නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් රංග භූමියක් වේ.

(2) වට රවුම් ( කවාකාර, ඇරීනා) අර්ධ කවාකාර, ප්‍රොසීනියම්...

| | | | | |
|---|---|---|---|---|
| | ඉ./ද. | ඉ./මැ. | ඉ./ව. | ඉහළ |
| ද | මැ./ද. | මැ./මැ. | මැ/ව. | වම |
| | ප./ද. | ප./මැ. | ප./ව. | පහළ |

(3) ⋆ රංග භූමිය සමතලා බිමක් විය යුතුය.

⋆ රඟ පෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතුය.

⋆ ප්‍රේක්ෂක පිරිසට පහසුවෙන් නැරඹිය හැක වන සේ පිහිටා තිබිය යුතුය.

⋆ රංගන ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම් වලින්වත් රංග භූමිය සමන්විත විය යුතුය.

(ල. 12)

(04) (1) අසා හෝ කියවා රස විඳීමට හැකි වීම.

සිද්ධි මාලාවක් සහිත වීම.

මුල්, මැද, අග ක්‍රමිකව ගලපා තිබීම.

(2) නිවැරදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(3) නිවැරදි කරුණු 06ක් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 12)

(05) (1) රූපණ ශිල්පීන් තම රංගනයෙන් ඉදිරිපත් කිරීමට පෙර කරනු ලබන අභ්‍යාසයන් වේ...වැනි අදහසක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(2) ⋆ සබකෝලය දුරු කර ගැනීම.

⋆ පරිකල්පනය වර්ධනය වීම.

⋆ ශරීරය සැහැල්ලු වීම.

⋆ හඬ පාලනය

⋆ සාමූහිකව වැඩ කිරීමේ හැකියාව වර්ධනය වීම.

⋆ ඉවසීම, අන්‍ය මත වලට ගරු කිරීමේ හැකියාව.

⋆ නිර්මාණාත්මක ශක්තිය දියුණු වීම ආදී.

නිවැරදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(3) නිවැරදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 12)

(06) (1) රට යකුම හෙවත් රිද්දි යාගය.

(2) ⋆ දරුවන් නොමැති ( වඳ ස්ත්‍රීන්ට) ගැබ් ඇති කිරීම.

⋆ ගර්භණී ස්ත්‍රීන්ගේ ගර්භයට ආරක්ෂාව ලබාදීම.

⋆ දරු ප්‍රසූතිය පහසුවෙන් සිදු කිරීම සඳහා අවශ්‍ය මානසික ශක්තිය ලබා දීමය.

(3) කපුයක්කාරිය / දොළහ පෙළපාලිය/ නානුමුරය/ එක් නාට්‍යයම පෙළපාලියක නාට්‍යමය ලක්ෂණ 05 ක් උදාහරණ සහිතව දක්වා, ප්‍රමාණාත්මකව පිළිතුරු සපයා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 12)

(7) 1. නාට්‍යෝචිත අවස්ථාවක් තිබීම සඳහා එනම් හොඳ ගැටුම් අවස්ථාවක් නිර්මාණය කිරීම වෙනුවෙන් (ල . 04)

2. පෙළක තිබෙන ආකාරයට රංග විධාන සහ ප්‍රබල සංවාද තිබේ නම් (ල . 04)

3. සමස්ථ නිමාව, එනම් ක්‍රමානුකූලව රචනය ගොඩනගා තිබේද යන්න, නාට්‍යයට නමක් සහ චරිත හඳුන්වා දී තිබීම, ආරම්භය අවසානය පැහැදිලිව තිබීම යන කරුණු සඳහා (ල . 04)

(මුළු ල . 12)